# පන්නිපිටිය මීසම

# දිව්‍ය පූජා අනුපිළිවෙළ

**(1) මනාලයා දිව්‍ය පූජාව ආරම්භ වීමට විනාඩි 10 කට පෙර පැමිණ දණ පුටුවේ දකුණු පස වාඩි වෙන්න.**

**(2) මනාලිය දිව්‍ය පූජාව ආරම්භ වීමට විනාඩි 05 කට පෙර වාහනයෙන් බැස දේවස්ථානයට පැමිණීම ආරම්භ කරන්න.**

**(3) දිව්‍ය පූජාව ආරම්භ වීම.**

**(4) පව් සමාව.**
(ඔබ කැමති නම් ගීතිකාවක් ගායනා කළ හැක. ඒ බව ගායනා කණ්ඩායමට දැනුම් දෙන්න.)

**(5) පළමුවන කියවීම.**
(මේ සදහා කෙනෙක් සූදානම් කරන්න.)

**(6) පිළිතුරු ගීය.**
(පළමුවන කියවීම කියවන අය විසින් ම කළ හැක. අවශ්‍ය නම් ගීතිකාවක් ගායනා කළ හැක. ඒ බව ගායනා කණ්ඩායමට දැනුම් දෙන්න.)

**(7) සුවිශේෂය සහ දේශනාව.**

**(8) විවාහ පිළිවෙත සිදු කිරීම.**
(මෙම අවස්ථාවේ දී සාක්ෂිකරුවන් දෙදෙනා ඉදිරියට පැමිණිය යුතුයි. විවාහ මුදු සහ මාල සූදානම් කර තබා ගන්න. පිළිවෙත අවසන් වූ පසු තම ආසන වෙත යාමට සාක්ෂිකරුවන් දැනුවත් කරන්න.)

**(9) සමගි ඉටි පහන.**
(ඔබ කැමති නම් සමගි ඉටි පහන දැල්වීමේ පිළිවෙත සිදු කල හැක. ඒ සදහා ඉටිපන්දම් 3 ක් සූදානම් කළ යුතු අතර ඉටිපන්දම් 2 ක් මනාලයා සහ මනාලිය දේවස්ථානයට ඇතුල් වූ පසු වෙන වෙනම දල්වා දණ පුටුවට යා යුතුය. ප්‍රධාන ඉටිපන්දම විවාහ පිළිවෙතින් පසු දෙදෙනා එක්ව දල්වයි.)

**සමගි ඉටි පහන් පහත දැක්වෙන ස්ථානවලින් මිල දී ගත හැක.**

- දයාමිණ කන්‍යාරාමය, නො.29, තලපත්පිටිය පාර, ඇඹුල්දෙනිය, නුගේගොඩ (0773433986)
- කතෝලික පොත්හල, ඥානාර්ථ ප්‍රදීප පාර, බොරැල්ල

**(10) විශ්වාසිකයින්ගේ යැදුම්.**
(මේ සදහා කෙනෙක් සූදානම් කරන්න.)

**(11) පඬුරු පෙරහැර.**
(විශ්වාසිකයින්ගේ යැදුමින් පසු පඬුරු පෙරහැර පැවැත්වේ.)

**(12) මනාලිය භාර ගැනීම.**
(දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගැනීමෙන් පසුව පියතුමා විසින් අන්තිම යාච්ඤාව කියවීමට පෙර සිදුකළ හැක. ඒ සදහා මනාලයාගේ මව හෝ සහෝදරිය පැමිණ මුහුණ ආවරණය ඉවත් කර සිපාචාර කර භාරගත හැක.)

**(13) දෙමාපියන් නැමදීම.**
(මෙම පිළිවෙත් කිරීමට ඔබ කැමති නම් අවසාන ආශිර්වාදයෙන් පසු එය කළ හැක. මෙම පිළිවෙත ඔබ සිදු කරන්නේ නම්, මනාලයාගේ සහ මනාලියගේ දෙමාව්පියන් ඉදිරියට පැමිණෙන අතර දෙමව්පියන් නැමදීමේ ගීතිකාව ගයන විට දෙමාපියන් නැමදීම සිදු කරන්න.)

**(14) විවාහය අත්සන් කිරීම.**
(දෙමාපියන් නැමදීම සිදු කරන්නේ නම්, ඉන් අනතුරුව විවාහ අත්සන් කිරීමට සූදානම් කර ඇති ස්ථාන වෙත යන්න. එසේ දෙමාපියන් නැමදීම සිදු නොකරන්නේ නම්, අවසාන ආශිර්වාදයට පසු විවාහ අත්සන් කිරීමට සූදානම් කර ඇති තැන් වෙත යන්න.)

ඔබ විවාහ දිව්‍ය පූජාව සදහා ගීතිකා කොලයක් සූදානම් කරන්නේ නම්,
මෙම අනු පිළිවෙල අනුව සකස් කරන්න.

මීසම් භාර පියතුමා
ක්‍රිස්තුරාජ දේවස්ථානය - පන්නිපිටිය